# තක්කාලි වගාව

## රෝග හා පළිබෝධ හඳුනාගැනීම හා මර්ධනය කිරීම

## රූපමය කාඩ් පත්

ශ්‍රී ලංකාව තුළ පළිබෝධනාශක සහ පොහොර
ආරක්ෂාකාරීව සහ නිවැරදි භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
www.safe.doa.gov.lk



# තක්කාලි වගාව

## රෝග හා පළිබෝධ හඳුනාගැනීම හා මර්ධනය කිරීම

## තාක්ෂණික දායකත්වය

- ටී. කේ. ඒ. අයි. හජ්ජි - ප්‍රාදේශීය පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, බණ්ඩාරවෙල
- එච්. ඒ. එස්. එන්. හෙට්ටිආරච්චි - කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, සීතාඑළිය
- එම්. එස්. ඩබ්. ප්‍රනාන්දු - උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නෝරුව
- ආචාර්ය පී. එච්. රණවීර - උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නෝරුව
- කේ. පුෂ්පාංජි - කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, සීතාඑළිය
- ආචාර්ය ජේ. පී. මාරසිංහ - පළිබෝධ නාශක රෙජිස්ටාර් කාර්යාලය, පේරාදෙණිය

## සැකසුම

- පී. එස්. පී. තෙන්නකෝන් - ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නෝරුව
- කේ. ඒ. යු. එන්. එන්. බණ්ඩාර - ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නෝරුව





කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය
2024

# තක්කාලි ගෙඩි හා පත්‍ර කණින්නා



### හානි වූ පත්‍රයක්

කීටයන් පත්‍ර මධ්‍යයේ පටක කා දමයි. හානිය අධික වූ විට පත්‍ර ලා දුඹුරු පැහැයට හැරී වියළී මියයයි.



### හානි වූ ගෙඩියක්

කීටයන් ළපටි හා ඉදුණු ඵලවල අභ්‍යන්තර කොටස් ආහාරයට ගනී. පිටකරන මලපහ ගෙඩිවල නටුව ආසන්නයේ දැකගත හැක.



### කීටයා

නොමේරූ කීටයන් මි.මී. 0.5 ක් පමණ දිග වේ. ලා කහ හෝ කොළ පැහැවේ. පරිණත කීටයන් මි.මි. 7ක් පමන වේ. කොළ-රෝස පැහැ වේ. හිස පිටුපසට වන්නට වර්ධනය වන අඳුරු පටියක් ඇත.



### සුහුඹුල් සළබයා

මි.මී. 5-7 ක් පමණ වේ. දුඹුරු-අළු පැහැයට හුරු සළබයෙකි. දිවා කාලයේදී පත්‍ර අතර සැඟවී සිටින අතර රාත්‍රියට සක්‍රීය වේ.





# තක්කාලි ගෙඩි හා පත්‍ර කාණින්නා

## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

| කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| ස්පිනොටොරාම් 25% WG | ග්‍රෑම් 4 |
| එමමැක්ටින් බෙන්සොඒට් 5% SG | ග්‍රෑම් 6 |
| ඇබමැක්ටින් 18 g/l EC | මි.ලී. 10 |
| ඉන්ඩොක්සකාර්බ් 150 g/l EC | මි.ලී. 6 |

✷ ප්‍රතිරෝධිතාවක් දැකිය හැකි බැවින් එකම කෘමිනාශකය දිගින් දිගටම යෙදීමෙන් වළකින්න. ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම සමග භාවිතා කරන්න.



## වෙනත් පාලන ක්‍රම

- ❖ මුල් අවස්ථාවේ හානිකල කොළ, ගෙඩි සහ අනෙකුත් කොටස් දිනපතා ඉවත් කර විනාශකිරීම.
- ❖ සුහුඹුලන් අඩු කිරීම සඳහා බල්බ උගුල්, ෆෙරමෝන් උගුල් හෝ ඇලෙන උගුල් භාවිතා කිරීම.

## වළක්වා ගැනීම

- ❖ වගාව ස්ථාපනයට පෙර, පෙර කන්නයේ බෝග අවශේෂ ඇත්නම් විනාශ කිරීම.
- ❖ නිරෝගී ගුණාත්මක පැල භාවිතා කිරීම.
- ❖ බෝග මාරුව අනුගමනය කිරීම (සොලනේසියස් කුලයට අයත් නොවන බෝග සමග).
- ❖ ආරක්ෂිත ගෘහ තුළ වගාවට නැවත භාවිතා කරන වගා මාධ්‍ය ජීවානුහරණය කිරීම.

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# තක්කාලි ගෙඩි විදින දළඹුවා









**හානි වූ ගෙඩි**

දළඹුවන් ගෙඩි වල රවුම් හැඩැති සිදුරු ඇති කරමින් ඇතුවී අභ්‍යන්තරය ආහාරයට ගනී. හානිකල ගෙඩි ඉක්මනින් ඉදී පසුව කුණු වේ. ළපටි පත්‍ර හා මල්ද ආහාරයට ගැනීමෙන් ඒවාද හානිවේ.

**කීටයා**

වැඩුනු කීටයන් කහ-කොළ පැහැ ගනී. සෙ.මී. 2.5 ක් පමණ වේ. ශරීරයේ දෙපස දික් අතට දුඹුරු පැහැයට හුරු තද සහ ලා පාට ඉරි ඇත.

**සුහුඹුල් සළබයා**

මි.මී. 14–18 පමණ දිගය. පිරිමි සළබයා කොළ පැහැති අළු සහ ගැහැණු සළබයා තැඹිලි – දුඹුරු පැහැ ගනී. පූර්ව පියාපත්වල කළු ලපයක් ඇත. සුදු පැහැ අපර පියාපත්වල දාර කළු පැහැ වේ. රාත්‍රී කාලයේදී සක්‍රීය වේ.

# තක්කාලි ගෙඩි විදින දළඹුවා

## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

| කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| ක්ලෝරැන්ට්‍රැනිලිපෝල් 200 g/l SC | මි.ලී. 4 |
| ෆ්ලූබෙන්ඩියාමයිඩ් 24% WG | ග්‍රෑම් 5 |
| නොවැලියුරෝන් 100 g/l EC | මි.ලී. 16 |
| ක්ලෝර්ෆ්ලුසුරොන් 50 g/l EC | මි.ලී. 24 |
| ෆ්ලූබෙන්ඩියාමයිඩ් 20% WG | ග්‍රෑම් 6 |

✸ මල් පිපෙන අවධියේදී යොදන්න. අවශ්‍ය නම් දින 10-14 කින් ඵල හට ගැනීමේ දී නැවත යොදන්න.



## වෙනත් පාලන ක්‍රම

- මුල් අවස්ථාවේ හානිකල ගෙඩි ක්ෂේත්‍රයෙන් දිනපතා ඉවත් කර විනාශ කිරීම
- සුහුඹුලන් අඩුකිරීම සඳහා බල්බ උගුල්, ෆෙරමෝන උගුල් භාවිත කිරීම.

## වළක්වා ගැනීම

- වගාව ස්ථාපනයට පෙර, පෙර කන්නයේ බෝග අවශේෂ ඇත්නම් විනාශ කිරීම.
- නිරෝගී ගුණාත්මක පැල භාවිතා කිරීම.
- බෝග මාරුව අනුගමනය කිරීම (සොලනේසියස් කුලයට අයත් නොවන බෝග සමග).

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# පත්‍ර කණින්නා



**හානි වූ පත්‍ර**

කීටයන් පත්‍ර අභ්‍යන්තර කොටස් ආහාරයට ගැනීම නිසා සිහින් සුදු පැහැති රටාවන් ඇති වේ.



**හානි වූ ශාක**

අධික ලෙස හානිය ඇති විට පත්‍ර වියළී යයි.



**කීටයා**

අත් කාචයක් ආධාරයෙන් පත්‍ර හොඳින් නිරීක්ෂණය කළහොත් කීටයා සජීවී නම් ශරීරය කහ පැහැතිව උමග තුළ එහා මෙහා සෙළවෙනු ද කීටයා අජීවී නම් දුර්වර්ණ සිරුරක් සහිතව ද දැකගත හැක.



**සුහුඹුල් මැස්සා**

මි.මී. 2 ක් පමණ දිග කළු පැහැ මැස්සෙකි. ඇස් දෙක අතර ප්‍රදේශය කහ පැහැතිය.

# පත්‍ර කණින්නා

## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

| කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| කොහොඹ ඇට නිස්සාරකය | ග්‍රෑම් 640 |



## වෙනත් පාලන ක්‍රම

❖ හානි වූ පත්‍ර කපා විනාශ කිරීම.

❖ ඇලෙන උගුල් භාවිතා කිරීම.

## වළක්වා ගැනීම

❖ ආසාදිත වගාවන් ආසන්නයේ නව වගා ආරම්භ කිරීමෙන් වැළකීම.

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# මූල ගැටිති වටපණුවන්





**හානි වූ ශාක**

පත්‍ර කුඩාවීම හා කහවීම සිදුවේ. ශාකය මැළවුනු ස්වභාවයක් පෙන්වයි. වර්ධනය බාලවී කුරුවෙයි.

**හානි වූ මුල්**

මුල්වල ගැටිති දැකිය හැක. පියවි ඇසට නොපෙනෙන ශාක රෝගකාරකයෙකු හේතුවේ.

# මූල ගැටිති වටපණුවන්



## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

- ❖ නිර්දේශිත වටපණුනාශක නොමැත.

## වෙනත් පාලන ක්‍රම

- ❖ හානි වූ ශාක ගලවා පසුත් සමඟ ඉවත් කිරීම.

## වළක්වා ගැනීම

- ❖ වගාවට පෙර සන්හෙම්ප් හෝ අබ සිටුවා ඒවා පසට මිශ්‍ර කිරීම.
- ❖ තවාන් සඳහා භාවිත කරන පස හොඳින් ජීවානුහරණය කිරීම.
- ❖ ගැඹුරට සීසා පස හිරු එළියට නිරාවරණය වීමට ඉඩහැරීම.
- ❖ නිරෝගී පැල වගාව සඳහා යොදා ගැනීම.
- ❖ දිරිය පවත්වා ගැනීමට කාබනික හා රසායනික පොහොර නියමිත පරිදි යෙදීම.
- ❖ මූල ගැටිති වටපණු හානියට පාත්‍ර නොවන බඩ ඉරිඟු, කව්පි වැනි බෝග සමඟ බෝග මාරුව



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# යුෂ උරාබොන කෘමීන් (පැළ මැක්කා, කුඩිත්තා, සුදු මැස්සා)









**පැලමැක්කන්ගේ හානිය**

සිහින් මි. මි. 1 ක් පමණ දිග කහ–දුඹුරු පාට වේ. වේගයෙන් එහා මෙහා යයි. පත්‍රවල යට පැත්තේ සිට යුෂ උරා බොයි. පත්‍ර තලයේ රිදීවන් සුදු තිත් දිස්වේ. තක්කාලි මැලවීමේ වෛරස් රෝග වාහකයායි.

**සුදුමැස්සන්ගේ හානිය**

සුදු පැහැතිය. මි.මි. 1–2 ක් පමණ දිග වේ. පත්‍රවල යටිපැත්තේ සිට යුෂ උරා බොයි. පත්‍ර කහ පැහැයට හැරී පත්‍ර නාරටි පැහැදිලිවීමට පටන් ගනී. ශාකයේ වර්ධනය බාල වේ. කොළ කොඩ වීමේ වෛරස් රෝග වාහකයායි.

**කුඩිත්තන්ගේ හානිය**

මි.මී. 1–1.5 පමණ වේ. පෙයාස් හැඩැති කොළ–කහ, කොළ–කළු හෝ රෝස පැහැතිය. පත්‍ර යටි පැත්තේ, කදේ හා අග්‍රස්ථ අංකුර වල ගනාවාස ලෙස සිටිමින් යුෂ උරාබොයි. පත්‍ර හා අග්‍රස්ථ අංකුර මැලවීම, අක්‍රමවත් පත්‍ර ඇතිවීම, පත්‍ර හැකිලීම හා පත්‍ර මත දැලි පුස් ඇති වීම සිදුවේ. පිපිඤ්ඤා විචිත්‍ර වෛරසය වාහකයන්ය.

# යුෂ උරාබොන කෘමීන් (පැළ මැක්කා, කුඩිත්තා, සුදු මැස්සා)

## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

| කෘමියා | කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|---|
| පැළ මැක්කා<br>කුඩිත්තා<br>සුදු මැස්සා | පයිමෙට්‍රෝසීන් 50% WG | ග්‍රෑම් 08 |
| පැළ මැක්කා<br>කුඩිත්තා<br>සුදු මැස්සා | පොටෑසියම් සෝල්ට් ෆැට් ඇසිඩ් 500 g/l EW | මි.ලී. 160 |
| පැළ මැක්කා<br>කුඩිත්තා | ඉමිඩක්ලෝප්‍රිඩ් 70% WG | ග්‍රෑම් 02 |
| පැළ මැක්කා<br>කුඩිත්තා | ඉමිඩක්ලෝප්‍රිඩ් 200 g/l SL | මි.ලී. 16 |
| පැළ මැක්කා<br>කුඩිත්තා | තයාමෙතාක්සාම් 25% WG | ග්‍රෑම් 05 |
| කුඩිත්තා<br>සුදු මැස්සා | තෛයෝසයික්ලාම් 50% SP | ග්‍රෑම් 40 |



## වෙනත් පාලන ක්‍රම

- ඇලෙන උගුල් භාවිතා කිරීම.
- පත්‍රවල යටි පැත්ත හොඳින් සේදී යන සේ ජලය යෙදීම.
- ජෛව පාලන ක්‍රම යොදා ගැනීම.
- කොහොඹ ඇට නිස්සාරකය යෙදීම.

## වළක්වා ගැනීම

- වගාව ස්ථාපනයට පෙර, පෙර කන්නයේ බෝග අවශේෂ ඇත්නම් විනාශ කිරීම.
- ක්ෂේත්‍රය තුළ හා අවට හොඳින් වල් මර්ධනය කිරීම.
- වගාව ස්ථාපිත කිරීමට පෙර සිටම වගා ක්ෂේත්‍රය වටා බාධක වැටක් (කෘමි දැල්, බඩඉරිඟු, කුරක්කන්, සෝගම් හෝ වෙනත් ද්‍රව්‍යක් මඟින්) ස්ථාපිත කිරීම.
- ක්ෂේත්‍ර සනීපාරක්ෂාව පවත්වා ගැනීම.
- බෝගයට පිදුරු හෝ පොලිතීන් වසුන් යෙදීම.

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# පූර්ව අංගමාර රෝගය







### හානි වූ පත්‍රයක්

ඇතුලට ක්‍රමයෙන් කුඩාවන කළු පැහැති මුදු ආකාර වලයන් රාශියක් සහිත දුඹුරු පැහැති පුල්ලි පත්‍රවල ඇතිවේ. පුල්ලි වටා කහ පැහැති ප්‍රදේශයක් දැකිය හැකිය. මේරූ පත්‍රවල පළමුවෙන්ම පුල්ලි හටගන්නා අතර පසුව ඉක්මනින් ඉහළ පත්‍ර කරා ව්‍යාප්ත වෙයි. හානිය අධික විට සම්පූර්ණ පත්‍රයම කහ පැහැවී ඉක්මනින් වියළෙයි.

### හානි වූ ගෙඩියක්

ඉදීමට පෙර තද දුඹුරු පැහැති ගිළුන ස්වභාවයෙන් යුත් පැල්ලම් ඇතිවේ.

### හානි වූ ශාක

ආසාදනයේ පසු අවස්ථාවේදී පත්‍ර නටු මත හා කඳෙහි ද පුල්ලි ඇතිවේ.

# පූර්ව අංගමාර රෝගය

## රසායනික පාලනය - නිර්දේශිත දිලීර නාශක

| දිලීර නාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| මැන්කොසෙබ් 80% WP * | ග්‍රෑම් 32 |
| මැන්කොසෙබ් 75% WG * | ග්‍රෑම් 32 |
| අයිසොප්‍රොතියලෝන් 400 g/l EC ** | මි.ලී. 40 |
| ෆ්ලූවසිනාම් 500 g/l SC * | මි.ලී. 16 |
| ක්ලෝරෝතලෝනිල් 500 g/l SC * | මි.ලී. 48 |
| ක්ලෝරෝතලෝනිල් 75% WP * | ග්‍රෑම් 32 |
| ප්‍රොපිනේබ් 70% WP * | ග්‍රෑම් 32 |
| මැනේබ් 80% WP * | ග්‍රෑම් 32 |
| මැන්කොසෙබ් 64% + මෙටලක්සිල් 8% WP ** | ග්‍රෑම් 40 |
| මැන්කොසෙබ් 60% + ඩයිමෙතොමෝෆ් 9% WP ** | ග්‍රෑම් 80 |

| දිලීර නාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| මෙටිරාම් 55% + පයිරෝක්ලොස්ට්‍රොබින් 5% WG ** | ග්‍රෑම් 32 |
| අසොසිස්ට්‍රිබින් 120 + ටෙබුකොනසෝල් 200 g/l SC ** | මි.ලී. 24 |
| මැන්කොසෙබ් 64% + මෙටලැක්සිල් - M 4% WG ** | ග්‍රෑම් 40 |
| කැප්ටාන් 50% WP ** | ග්‍රෑම් 32 |
| කැප්ටාන් 80% WG ** | ග්‍රෑම් 20 |
| ඩිෆෙනකොනසෝල් 250 g/l EC ** | මි.ලී. 24 |

## වෙනත් පාලන ක්‍රම

❖ ආසාදිත ශාක කොටස් ඉවත් කිරීම.

## වළක්වා ගැනීම

❖ සුදුසු කාලයේ වගාව ස්ථාපනය කිරීම.

❖ සිටුවීමට පෙර, පෙර කන්නයේ සියළුම ශාක අවශේෂ විනාශ කිරීම.

❖ වගා බිම ආවරණය වන සේ පිදුරු වැනි වසුනක් යෙදීම.

* ස්පර්ශ දිලීර නාශක - අඩු ආසාදන තත්ව ඇති විට යෙදීම සඳහා

** සංස්ථානික දිලීර නාශක - වැඩි ආසාදන තත්ව ඇති විට යෙදීම සඳහා

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# තක්කාලි පශ්චිම අංගමාරය



**ආසාදිත පත්‍රයක් (උඩුපැත්ත)**

තෙත සහිත දුඹුරු හෝ කළු පැහැති පැල්ලම් හටගනී.



**ආසාදිත පත්‍රයක් (යටිපැත්ත)**

පත්‍රයේ පැල්ලම් ඇති ස්ථානයේ යටි පැත්තේ සුදු පැහැති පුස් ස්වභාවයක් හට ගනී.



**ආසාදිත ශාකයක්**

කදේ දුඹුරු හෝ කළු පැල්ලම් හටගනී.



**ආසාදිත ගෙඩියක්**

රෝගය දරුණු අවස්ථාවේ දී ගෙඩි වලට රෝගය පැතිරී ගෙඩි ඇතුලත දුඹුරු පැහැවේ.

# තක්කාලි පශ්චිම අංගමාරය

## රසායනික පාලනය - නිර්දේශිත දිලීර නාශක

| දිලීර නාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| මැන්කොසෙබ් 80% WP * | ග්‍රෑම් 32 |
| මැන්කොසෙබ් 75% WG * | ග්‍රෑම් 32 |
| ෆ්ලුවසිනාම් 500 g/l SC * | මි.ලී. 08 |
| ක්ලෝරෝතලෝනිල් 500 g/l SC * | මි.ලී. 48 |
| ක්ලෝරෝතලෝනිල් 75% WP * | ග්‍රෑම් 32 |
| ප්‍රොපිනේබ් 70% WP * | ග්‍රෑම් 32 |
| මැනේබ් 80% WP * | ග්‍රෑම් 32 |
| මැන්කොසෙබ් 64% + මෙටලක්සිල් 8% WP ** | ග්‍රෑම් 40 |
| මැන්කොසෙබ් 60% + ඩයිමෙතොමෝෆ් 9% WP ** | ග්‍රෑම් 80 |
| මෙටිරාම් 55% + පයිරෝක්ලොස්ට්‍රොබින් 5% WG ** | ග්‍රෑම් 32 |

| දිලීර නාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| අසොසිස්ට්‍රිබින් 250 g/l SC ** | මි.ලී. 16 |
| මැන්කොසෙබ් 64% + මෙටලැක්සිල් - M 4% WG ** | ග්‍රෑම් 40 |
| ප්‍රොපමොකාබ් 607 g/l SC * | මි.ලී. 64 |
| අයිසොප්‍රොතියලෝන් 400 g/l EC ** | මි.ලී. 40 |
| ඩිෆෙනකොනසෝල් 250 g/l EC ** | මි.ලී. 24 |

## වෙනත් පාලන ක්‍රම

❖ වගාවේ ආසාදනය පළමුවෙන්ම දුටු අවස්ථාවේදීම ආසාදිත ශාක කොටස් ඉවත් කිරීම.

## වළක්වා ගැනීම

❖ පෙර කන්නයේ බෝග අවශේෂ විනාශකිරීම.

❖ නියමිත කාලයේදී වගාව ස්ථාපනය කිරීම.

* ස්පර්ශ දිලීර නාශක - අඩු ආසාදන තත්ව ඇති විට යෙදීම සඳහා

** සංස්ථානික දිලීර නාශක - වැඩි ආසාදන තත්ව ඇති විට යෙදීම සඳහා

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# දුඹුරු පැල්ලම් රෝගය



**ආසාදිත පත්‍රයක් (යටිපැත්ත)**

පත්‍ර යටි පැත්තේ අළු දුඹුරු පැහැති පැල්ලම් ඇති වේ. ඒවා පසුව විශාල වී සියළු පත්‍ර වලට පැතිරේ. පත්‍ර මතුපිට දුඹුරු පැහැ වී වියළී යයි.



**ආසාදිත පත්‍රයක් (උඩුපැත්ත)**

තරමක් මේරූ පත්‍ර මතුපිට ලා කොළ/කහ පැහැයට හුරු අක්‍රමවත් දාරයක් සහිත පැල්ලම් ඇති වේ.

# දුඹුරු පැල්ලම් රෝගය

## රසායනික පාලනය - නිර්දේශිත දිලීර නාශක

| දිලීර නාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| ක්ලෝරෝතලෝනිල් 500 g/l SC | මි.ලී. 48 |
| තයෝෆනේට් - මෙතිල් 70% WP | ග්‍රෑම් 16 |
| ක්ලෝරෝතලෝනිල් 75% WP * | ග්‍රෑම් 32 |

## වෙනත් පාලන ක්‍රම

- හානිය දුටු වහාම රෝගී ශාක කොටස් ඉවත්කර විනාශ කිරීම.



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# වෛරස් රෝග

## ( තක්කාලි මැලවීමේ වෛරස් රෝගය, පිපිඤ්ඤා විචිත්‍ර වෛරස් රෝගය, කර්ලිටොප් වෛරස් රෝගය, කොල කොඩවීමේ වෛරස් රෝගය )



**පැළ මැක්කන් මගින් ව්‍යාප්ත වන තක්කාලි මැලවීමේ වෛරස් රෝගය සහිත පත්‍ර**

වැඩෙන පත්‍රවල අග්‍රස්ථ වියළී යයි. රවුම් හැඩැති රතු-කහ පැල්ලම් හට ගැනීම නිසා පත්‍ර තඹ පැහැවෙයි. මේරූ පත්‍ර කහ පැහැවේ. කදෙහි හා නටුවල තද පැහැති ඉරි හට ගනී. ගෙඩි මත කොළ, කහ හෝ රතු පැහැති තරමක් ඉස්සුන ස්වභාවයේ ඉලිප්සාකාර පැල්ලම් හට ගනී.



**කුඩිත්තන් මගින් ව්‍යාප්ත වන පිපිඤ්ඤා විචිත්‍ර වෛරස් රෝගය සහිත පත්‍ර**

රෝගී ශාකවල පත්‍රවල මඳ වශයෙන් කොළ පැහැති පැල්ලම් ආකාරයේ ස්වභාවයක් හෝ පත්‍රිකා සිහින් වී නාරටි පමණක් පෙන්නුම් කරන තත්වයක් දිස්වේ. පත්‍ර දිග නොහැරෙන තත්වයක් හා පත්‍රිකා හැකිලී යාමද සිදුවිය හැක.



**පත්‍ර කීඩෑවන් මගින් ව්‍යාප්ත වන කර්ලිටොප් වෛරස් රෝගය සහිත පත්‍ර**

පත්‍ර දුඹුරු පැහැ වේ. උඩු අතට හැකිළේ. නාරටි දම් පැහැයට හැරේ. පත්‍ර ඝන වී කැඩෙන සුළු වේ. ගෙඩි මත දුඹුරු පැල්ලම් ඇතිවේ. කුඩා කාළයේදී වැළඳුනහොත් පැළ මියයයි. වැඩෙන පැළ වලට වැළඳුන විට ශාක කුරු වේ.



**සුදු මැස්සන් මගින් ව්‍යාප්ත වන තක්කාලි කොළ කොඩවීමේ වෛරස් රෝගය සහිත ශාකයක්**

රෝගී ලක්ෂණ පළමුව ළපටි පත්‍රවල හටගනී. පත්‍ර කුඩා වෙයි. පත්‍රවල නාරටි අතර ප්‍රදේශ කහ පාට වෙයි. පත්‍රිකා හැකිලෙයි. පාර්ශවික අංකුර විශාල සංඛ්‍යාවක් හට ගැනීම සහ මල්වලින් ගෙඩි හට නොගනී. රෝගී ශාක කුරු වෙයි.

# වෛරස් රෝග ( තක්කාලි මැලවීමේ වෛරස් රෝගය, පිපිඤ්ඤා විචිත්‍ර වෛරස් රෝගය, කර්ලිටොප් වෛරස් රෝගය, කොල කොඩවීමේ වෛරස් රෝගය )



## රසායනික පාලනය - නිර්දේශිත රසායනික

- මෙම රෝගය සඳහා නිර්දේශිත රසායනික පාලනයක් නොමැත.

## වෙනත් පාලන ක්‍රම

- ආසාදිත පැල ඉවත්කිරීම
- රෝග වාහකයන් පාලනයට කෘමිනාශක යෙදීම

## වළක්වා ගැනීම

- සිටුවීමට පෙර, පෙර කන්නයේ සියළුම ශාක අවශේෂ විනාශ කිරීම
- රෝග වාහකයන්ගේ ධාරක ශාක වන වල්පැළෑටි පාලනය කිරීම
- නිරෝගී බීජ භාවිත කිරීම



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# බැක්ටීරියා හිටු මැරීම



### ආසාදිත ශාකයක්

ආරම්භක රෝග ලක්ෂණය වන්නේ තනි අතු හෝ අතු කිහිපයක් සුළු වශයෙන් මැළවී යාම

දින කිහිපයකට පසු මුළු ශාකයම හදිස්සියේ ස්ථිර ලෙස මැළවී යාම



### රෝගය හඳුනා ගැනීම

කඳ කපා ජලයට දැමූ විට සුදුපාටට බැක්ටීරියා ශ්‍රාවය පිටවේ.



### ආසාදිත කඳ

ආසාදිත ගස්වල කඳ ඇතුලත දුඹුරු පාට වේ.

# බැක්ටීරියා හිටු මැරීම

## රසායනික පාලනය - නිර්දේශිත රසායනික

* මෙම රෝගය සඳහා නිර්දේශිත රසායනික පාලනයක් නොමැත.



## වෙනත් පාලන ක්‍රම

- රෝගී ගස් ගලවා විනාශ කිරීම.
- රෝගී ගස් තිබූ ස්ථාන වල සිට වගාවේ අනෙකුත් ස්ථාන වලට ගලා නොයන සේ ජලය යෙදීම.

## වළක්වා ගැනීම

- අවම වශයෙන් වසර 3ක් වත් පෙර කන්නයේ රෝග පැවති බිම් වගාවට යොදා නොගැනීම.
- අවම වශයෙන් වසර 3 ක් පමණ සොලනේසියේ කුලයට අයත් බෝග වගා කළ බිමක් වගාවට යොදා නොගැනීම.

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

ශ්‍රී ලංකාව තුළ පළිබෝධනාශක සහ පොහොර
ආරක්ෂාකාරීව සහ නිවැරදි භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

www.safe.doa.gov.lk